පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 222

ආයතනයේ නම : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

| | කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | ඊට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| 1 | ඊ - ඉඩම්, ජනගහන, ඊ-උපත් විවාහ මරණ හා ඊ-හිමිකම් යන මෘදුකාංග ව්‍යාපෘති සම්බන්ධව | ඉ-ඉඩම් ව්‍යාපෘතිය අදියර 3 කින් සමන්විතය. එහි I වන අදියරය සම්පූර්ණ කර, 2024 වර්ෂය වන විට කාර්යාල 09 ක් ස්ථාපිත කර ඇත. |
| | | එමෙන්ම 2024 වර්ෂයේ දෙසැම්බර් වන විට II වන අදියර අවසන් කර නියමු කාර්යාල 9 න් දැනට කාර්යාල 6ක දෙවන අදියර ක්‍රියාත්මක කරමින් පවතී. |
| | | මෙහි III වන අදියර 2025 දෙසැම්බර් වන විට අවසන් කිරිමට නියමිතය |
| | | 2025 වර්ෂයේදී I වන අදියර කාර්යාල 15 ක ස්ථාපනය කිරිමට සැලසුම් කර ඇති අතර ඊට අමතරව අනෙකුත් කාර්යාල සඳහා ක්‍රමානුකුලව I වන අදියර ස්ථාපනය කිරිම සඳහා අවශ්‍ය මූලික කටයුතු දැනට සිදු කරමින් පවතී. (කාර්යාල 50 සඳහාම) |
| | | මෙම වර්ෂයේ කාර්යාල 18 ක පත්ඉරු පරිලෝකනය කිරිමට කටයුතු ආරම්භ කර ඇති අතර කාර්යාල 50 කින් 2023 හා 2024 වර්ෂ වලදී කාර්යාල 21 ක් දැනට පරිලෝකනය කර ඇත. මෙම වර්ෂය අවසානයේදී කාර්යාල 39 ක පත්ඉරු පරිලෝකනය කර ඇත. |
| | | මෙම මෘදුකාංගයෙහි III වන අදියර අවසන් වූ පසු Ramis පද්ධතිය සමඟ ඒකාබද්ධ වීමට හැකියාවක් ඇත. |
| | | මාර්ග ගත ක්‍රමයට පත්ඉරු පිටපත් නිකුත් කිරිම සඳහා III වන අදියරයේ කටයුතු අවසන් කර ගත යුතුව ඇත. |
| | | 2024 වර්ෂයේ මෘදුකාංගය සඳහා අවශ්‍ය උපාංග ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණි. |

| | | |
|---|---|---|
| 2 | උප්පැන්න සහතික ලියාපදිංචි කිරීමේ අංකය ලෙස ජාතික හැඳුනුම්පත් අංකයම යොදා ගැනීමේ ක්‍රමවේදය | මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක ඉ-ජනගහන ලේඛන වැඩසටහන යටතේ 2021.01.01 දිනෙන් පසුව සිදු වූ සියලු උපත් සඳහා ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීමේ කටයුතු මේ වන විට දිස්ත්‍රික්ක 23ක ආරම්භ කර ඇත. එසේම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජාතික උප්පැන්න සහතික නිකුත් කිරීම 2025.08.26 දින හා අම්පාර දිස්ත්‍රික්කයේ ජාතික උප්පැන්න සහතික නිකුත් කිරීම 2025.08.27 දින ආරම්භ කිරීමට නියමිතය. මෙම ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීමේ දී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ එක්ව සෑම උපතක් සඳහාම ඒකීය අනන්‍යතා අංකයක් නිකුත් කරන අතර මේ වන විට මෙම වැඩසටහන ක්‍රියාත්මක දිස්ත්‍රික්ක 23හි ජාතික උප්පැන්න සහතික නිකුත් කිරීමේදී මෙම ඒකීය අංකය සහිතව සහතික නිකුත් කරනු ලබයි. |
| | | මෙම ඒකීය අනන්‍යතා අංකය යනු පුද්ගලයාට අවු.15 දී නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පත් අංකයම වේ. මෙම අංකය ජාතික උප්පැන්න සහතිකයේ සඳහන් වනුයේ “මගේ අංකය” ලෙසිනි. මෙම ඒකීය අනන්‍යතා අංකය නිකුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද 2021.11.10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක MOD/CP/IA/170/2021 සඳහා ලද අනුමැතිය මත පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ 2022.06.28 වන දින අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදී. |

.....................................

ඒස්.ආලෝකබණ්ඩාර

ලේකම්,

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය